**සී.එස්.ලියනගේ**
**කළමණාකරණ හා මූල්‍ය පීඨය**

ලෝකය වෙනස් කළ හැකි ප්‍රබලතම අවිය අධ්‍යාපනයයි.

එහෙම කිව්වේ නෙල්සන් මැන්ඩෙලා.

මම ඔබට මෙහෙම කියනවා,

අහසට අලංකාරය චන්ද්‍රයා යි. කාන්තාවට ආභරණය පතිවත යි, පොළොවට අධිපති රජු යි, සියල්ලන්ට ම ආභරණය දැනුම යි.

එසේ නම් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය යන මාතෘකාවට අදාළ ව ඔබ ඉදිරියේ කරුණු දැක්වීමට සියලු දෙනාගෙන් අවසර යි.

අපි මුලින් ම බලමු සංවර්ධනය කියන්නේ මොකක්ද කියලා.

සංවර්ධනය කියන්නේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ සියලු ජන කොටස් අතර සාධාරණ ව බෙදී ගොස් ජනතාවගේ ජීවන මට්ටම ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව වර්ධනය වීමක්.

නමුත් සහෝදරවරුනි, අපේ මාතෘකාව ඇවිල්ලා තිරසාර සංවර්ධනය මිසක් සංවර්ධනය නො වෙයි. එසේ නම් අපි බලමු මොකක්ද තිරසාර සංවර්ධනය කියන්නේ කියලා.

වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කර ගන්නා අතර අනාගත පරම්පරාවේ ද අවශ්‍යතා ඉටු කර ගැනීමට සම්පත් ඉතිරි කරමින් පරිභෝජනය කිරීම තමයි තිරසාර සංවර්ධනය කියන්නේ.

මෙම තිරසාර සංවර්ධනයේ මූලිකාංග ලෙස සරත් කේ. ජයකොඩිට අනුව,

ආර්ථික දියුණුව
සමාජ දියුණුව
පාරිසරික දියුණුව ලෙස හඳුනාගන්න පුළුවන්.

අපි දැන් බැලුවා සංවර්ධනය කියන්නේ මොකක්ද? තිරසාර සංවර්ධනය කියන්නේ මොකක්ද? කියලා. අපි ඊළඟට බලමු, අධ්‍යාපනය කියන්නේ මොකක්ද කියලා.

අධ්‍යාපනයේ ඉතිහාසය ගැන කථා කළොත් ඒකට දිගු ඉතිහාසයක් තියෙනවා. මුලින් ම අපේ රටේ බෞද්ධ සම්ප්‍රදාය මත ගොඩනැගුණ පැරණි දේශීය අධ්‍යාපන ක්‍රමයක් පැවතුණා. එදා අධ්‍යාපනයේ අරමුණ වුණේ සදාචාර හා ආධ්‍යාත්මික ගුණවගාවෙන් යුත් පුද්ගලයකු බිහිකිරීම යි. ඊට පස්සෙ අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධ ව වැදගත් කාලපරිච්ජේදයක් වුණේ 1932- 1947 කාලය යි. මෙන්න මේ කාලයේ තමයි අධ්‍යාපනය සම්බන්ධ ව වැදගත් ප්‍රතිසංස්කරණ බිහිවුණේ ඒවායේ ප්‍රතිඵලයක් විදිහට 1945 කන්නංගර මැතිතුමා පොහොසතුන්ට ඒකාධිකාරයක් වෙලා තිබුණු අධ්‍යාපනය දුප්පතුන්ගේ නිත්‍ය උරුමයක් බවට පත් කළා. ඒ අධ්‍යාපනයේ ඉතිහාසය.

අධ්‍යාපනය කියන දේ නිර්වචනයක් විදියට පැහැදිලි කළොත්, මේ අධ්‍යාපනය කියන දේ කුඩා කාලයේ සිට මහලු වයස දක්වා ක්‍රියාත්මක වෙන චක්‍රයක්. විධිමත් අධ්‍යාපනය අවුරුදු 07 දී ආරම්භ වෙනවා. ඊට පස්සේ 7 සිට යෞවනය දක්වා ප්‍රාථමික යෞවනයේ සිට අවු 21 දක්වා ද්විතියක. ඉන් පසු උසස් අධ්‍යාපනය හා වැඩිහිටි/වෘත්තිය අධ්‍යාපනය ලෙස ක්‍රියාත්මක වෙනවා.

අධ්‍යාපනය කියන දේ දැනුම, කුසලතා හා ආකල්ප කියන ත්‍රිත්වයේ එකතුවක් විදියට මම දකිනවා. ඒ අනුව අධ්‍යාපනය තුළින් සිත, හිස, අත, සෞඛ්‍ය කියන චතුර්විධ අංශවලින් පරිපූර්ණ වූ මිනිසෙක් බිහි කරනවා.

අපි දැන් බැලුවා සංවර්ධනය, තිරසාර සංවර්ධනය, අධ්‍යාපනය

මීලඟට බලමු,

මෙන්න මේ අධ්‍යාපනය කොහොමද තිරසාර සංවර්ධනයට දායක වෙන්නෙ කියල.

මහාචාර්ය ෆ්‍රෙඩ්රික් හැරිසන්ට අනුව ජාතින්ගේ ධනයෙහි අවසන් පදනම දමන්නේ මානව සම්පත යි. ප්‍රාග්ධන සම්පත් රටක අක්‍රීය සාධක විශේෂයකි. එහෙත් මානව සම.පත් රටකට ප්‍රාග්ධනය ගොඩනගා දෙන, නිදන සම්පත් අවදි කරවන සක්‍රීය සාධකයකි. රටක් තිරසාර සංවර්ධනය කරා පියමං කිරීමට නම් ජනතාවගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කළ යුතු වෙනවා. යම් රටක ජාතිය සතු දැනුම කුසලතා, ආකල්ප අඩුනම්, ඒවා නිසි පරිදි උපයෝජනය වී නොමැති නම් එකී රටට තිරසාර සංවර්ධනය මිරිඟුවකි. එම දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනයට කරන ප්‍රධාන යාන්ත්‍රණය වන්නේ විධිමත් අධ්‍යාපනයයි.

රටක් සංවර්ධනය වෙන්න ඕන නම් ආර්ථික වර්ධනයක් විය යුතු යි. ආර්ථික වර්ධනයක් වෙන්න ඕන නම් රටේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යන්න ඕන, සේවා නියුක්තිය ඉහළ යන්න ඕන.

මානව සම්පත් සංවර්ධනය නිසා, එසේත් නැතිනම් මෙන්න මේ අධ්‍යාපනය නිසා, නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි වී ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදන ප්‍රමාණයේ වැඩිවීමක් සිදුවෙනවා. අන්න එතකොට රටේ තිරසාර සංවර්ධනයක් ඇති වෙනවා.

ඒ වගේ ම තමයි රැකියා අභිමුඛ අධ්‍යාපනය හේතුවෙන් රැකියා අවස්ථා වර්ධනය වෙලා රටේ සේවා නියුක්තිය ඉහළ යනවා.

ශ්‍රී ලංකාව කියන්නේ දියුණු වෙමින් පවතින රටක්. ඉතින් මේ වගේ රටවල් වලට තියෙන පොදු ගැටළුවක් තමයි ප්‍රාග්ධන සම්පත් අව ම වීම. නමුත් අපේ රටේ වාසනාවකට වගේ මානව සම්පත් බහුල යි. ඉතින් මේ බහුල ව තිබෙන මානව සම්පත අධ්‍යාපනය තුළින් සංවර්ධනය කරලා අවම ප්‍රාග්ධන සම්පත් හිඟය මඟහරවන්න මෙන්න මේ මානව සම්පත යොදා ගැනීම තුළිනුත් තිරසාර සංවර්ධනයකට යා හැකි යි.

එසේ ම අධ්‍යාපනයෙන් පරිපූර්ණ වූ මිනිසෙක්, බුද්ධිමතෙක්, උගතෙක් බිහිකරනවා. ඉතින් මේ සීමිත සම්පත් තියෙන ලෝකයේ අසීමිත වූ පරිභෝජන රටාවන්ට හුරු ව සම්පත් විනාශ කරනවා වෙනුවට අධ්‍යාපනය තුළින් අරපිරිමැසුම් ගතිවලින් පරිපූර්ණ මිනිසුන් බිහිකිරීම තුළින් පුළුවන් තිරසාර සංවර්ධනයකට යන්න.

ඒ වගේ ම තමයි අධ්‍යාපනය නිසා මිනිසාගේ මනස උපරිම මට්ටමකට වර්ධනය වෙලා තියෙනවා. අද දවසේ ඔවුන් සිදු කරන නවෝත්පාදන දිහා බැලුව ම අපට පේනවා, මිනිසුන් අධ්‍යාපනයත් එක්ක කොච්චර දුර ගිහිල්ල ද කියලා. අද ඔබ ඔතන ඉඳගෙන ඉන්න පුටුවෙ ඉඳලා අපි ලියන පෑන අධිවේගී මාර්ග, ගුවන් තොටුපල, වරාය මේ සියල්ල අධ්‍යාපනයේ ප්‍රතිඵල. මේවායින් තමයි රටක් තිරසාර සංවර්ධනය කරා ගමන් කරන්නෙ.

අපේ විශිෂ්ට ලේඛකයෙක් වන කුමාරතුංග මුනිදාස මහතා මෙහෙම කියලා තියෙනවා, 'අලුත්, අලුත් දෑ නො තනන ජාතිය ලොව නො නඟී කියලා. අලුත් දෙයක් හදන්න නම් යමක් දෙස තාර්කික ව බලලා එය ක්‍රියාවට නංවන්න ඕන. ඉතින් ඒකට මෙන්න මේ අධ්‍යාපනය ඕන. අද කෘෂිකර්මාන්තය, වෛද්‍ය ක්ෂේත්‍රය, ඉංජිනේරු විද්‍යාවේ අලුත්, අලුත් දේ අධ්‍යාපනයෙන් පරිපූර්ණ මිනිසුන් නිපදවද්දී, අපේ රට තිරසාර සංවර්ධනයට ළඟා නො වේවිද? නැහැ සහෝදරවරුනි, අපි ළඟා වෙනවා.

ඒ වගේ ම තමයි සහෝදරවරුනි රටක් තිරසාර සංවර්ධනයට ළඟා වෙන්නෙ ආර්ථික අතින් ම පමණක් නො වෙයි, ආචාරධර්ම යුතුකම් ඉටුකරන ගුණගරුක සමාජයකින්.

ඒවගේම තමයි සහෝදරවරුනි, රටක් තිරසාර සංවර්ධනයට ළඟා වෙන්න ආර්ථික අතින්ම පමණක් නොවෙයි රටක් ආචාරධර්ම,සාරධර්ම, යුතුකම් ඉටු කරන ගුණගරුක සමාජයකින් හෙබවීමත් බලපානවා.

අද අධ්‍යාපනයෙන් පරිපූර්ණ වූ මිනිසුන් සමාජ විරෝධී ක්‍රියා කරන්න බය යි. ඒ නිසා ඔවුන් ආචාර ධර්ම ඉටුකරන ගුණගරුක මිනිසුන් විදියට ක්‍රියා කරනවා. මම මෙතන ඉඳන් ඔබට මෙහෙම කියද්දි ඔබ ඔතන ඉඳන් කියාවි ඒ කථාව නම් සම්පූර්ණ බොරුවක්. උගත්තු කොච්චර වැරදි කරනවාද කියලා. නමුත් සහෝදරවරුනි මම මේ කථා කරන්නේ වැරදි කරන සුළුතරයක් ගැන නො වෙයි යහපත් ව සිටින බහුතරයක් ගැන යි.

බලන්න අද සිරගෙදරකට ගිහිල්ලා. ඒකේ ඉන්න සිරකරුවන්ගෙන් ඇහුවොත් බොහෝ දෙනෙක් අධ්‍යාපනය නොලැබූවන්.

ඔබ කථාවක් අහලා ඇති නේ එක පාසලක් ඇරිය ම සිරගෙවල් 10 ක් වැහෙනවා කියලා. ඉතින් අතීතයේ ඒ අපේ මුතුන් මිත්තන් ඒ කථාවල් කිව්වේ කට කහනවට නොවෙයි යථාර්ථය තේරුම් අරගෙන.

ඉතින් සහෝදරවරුනි, ධනාත්මක සිතුම් පැතුම් හා සමාජ සාරධර්මවලින් හෙබි සමාජයක් බිහිවීම තුළිනුත් සමෘද්ධිමත් තිරසාර සංවර්ධනයක් කරා යන්න අපට හැකිවෙනවා.

ඉහත සියලු කරුණු සලකා බැලූවිට අපට පෙනෙනුයේ තිරසාර සංවර්ධනය නැමැති දොර හරින යතුර අධ්‍යාපනය බව යි.